# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2254/10 - 2021 නොවැම්බර් මස 15 වැනි සඳුදා - 2021.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මියයාම හේතුකොට ගෙන කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක 06 කුඩාබුත්ගමුව කොට්ඨාසයට තේරී පත්වූ නිරිඇල්ල තානාපතිගේ සමන්ත රංගජීව ජයසිංහ අයත්වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක 06 කුඩාබුත්ගමුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කළුබෝවිල අප්පුහාමිලාගේ දොන් විපුල නානායක්කාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, මාපා මුදියන්සේලාගේ සේන කුමාරසිරි බණ්ඩාර මාපා වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කළුබෝවිල අප්පුහාමිලාගේ දොන් විපුල නානායක්කාර, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක 06 කුඩාබුත්ගමුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරි,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ

11 - 677

1A - G 35361 — 20 (2021/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*